මගේ අංකය / எனது இல / My No: DSD/HO/02/Ad/12/වා.ස්.මා/2021

ඔබේ අංකය / உமது இல / Your No: ..........

දිනය / திகதி / Date: 2021.01.05

සියළුම දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන් වෙත,

**<u>2013 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 21/2013 යටතේ</u>**
**<u>නිවාඩු දින වැටුප් ගෙවීම සඳහා අනුමැතිය ඉල්ලීම සම්බන්ධවයි</u>**

ඉහත කරුණ සම්බන්ධයෙන් 2020.09.04 වෙනි දින සමෘද්ධි ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන ගරු රාජ්‍ය අමාත්‍ය ෂෙහාන් සේමසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති වෘත්තීය සමිති රැස්වීමේ කළ සාකච්ඡාව හා බැඳේ.

02. ඒ අනුව, මූලස්ථාන කළමනාකරුවන් සඳහා සේවා අවශ්‍යතාවය මත නිවාඩු දින වැටුප් දීමනා මසකට දින 02 ක් සඳහා නිවාඩු දින වැටුප් ලබාදීම සඳහා අනුමැතිය ලබාදෙමි. ඒ අනුව, පහත දක්වා ඇති උපදෙස් පරිදි කටයුතු කරන ලෙස වැඩිදුරටත් දැනුම් දෙමි.

03. ඉහත සඳහන් කරුණ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ VIII වන පරිච්ඡේදයේ හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 21/2013 ට අදාළව දින වැටුප් ගෙවීමට අදාළ ආකෘතිපත්‍ර අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු අතර, ඒ අනුව පහත පියවර අනුගමනය කිරීමට ඔබ අංශයේ නිලධාරීන් දැනුවත් කරන මෙන් සමාජ ආරක්ෂණ හා රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අංක MWCA&SS/ADM/04/53/11 හා 2020.01.30 දිනැති ලිපියෙන් දැනුම් දී ඇත. (අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 01/2020 හි පිටපතක් අමුණා ඇත.)

i. නිවාඩු දින හා සති අන්ත දින සේවයේ යෙදීමට අපේක්ෂිත කාර්යයන් සඳහන් කරමින් ආසන්නතම රාජකාරි කරනු ලබන දිනයට පෙර අදාළ නිවාඩු දින වැටුප් ආසන්නතම රාජකාරි කරනු ලබන දිනයට පෙර අදාළ නිවාඩු දින වැටුප් ආකෘති පත්‍ර අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය. (ආකෘති පිටපතක් අමුණා ඇත)
ii. එක් එක් සති අන්ත නිවාඩු දිනයන්ට අදාළව වෙන වෙනම පූර්ව අනුමැතිය ලබාගත යුතුය.
iii. ඉන් අනතුරුව දීමනාව ලබා ගැනීම සඳහා ඉදිරිපත් කිරීමේ දී අනුමත කරන ලද නිවාඩු දින වැටුප් ආකෘති පත්‍රය සමඟ එක් එක් දිනයන් හී දී කළ වැඩ පිළිබඳව වාර්තාවක් සමඟ වවුචර්පත් අනුමැතියට ඉදිරිපත් කළ යුතුය.

එම්.ඒ.එම්. ආරිෆා,
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන),
අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට.


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |